Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2022 අගෝස්තු 15, කොළඹ

## 2022 වසරේ ශ්‍රී ලංකාවේ වඩාත්ම ගෞරවනීය ආහාර සහ පාන සමාගම ලෙස නෙස්ලේ ලංකා සමාගම නම් කෙරේ

- වඩාත්ම ගෞරවනීය සමාගම් 20 අතරටත් එක්වෙයි

නෙස්ලේ ලංකා සමාගම, LMD විසින් නිකුත් කරන ලද 2022 වසරේ වඩාත්ම ගෞරවනීය සමාගම් ලැයිස්තුවේ, 'වඩාත්ම ගෞරවනීය ආහාර සහ පාන සමාගම' ලෙස ශ්‍රේණිගත වීමට පසුගියදා සමත්විය. ඊට අමතරව, විවිධ කර්මාන්ත ක්ෂේත්‍ර නියෝජනය කරන ප්‍රසිද්ධ සමාගම් 100කටත් වැඩි සංඛ්‍යාවක් අතුරින්, මෙරට වඩාත්ම ගෞරවනීය සමාගම් ශ්‍රේණිගත කිරීමෙහි පළමු සමාගම් 20 අතරට පිවිසීමට ද නෙස්ලේ ලංකා සමාගමට හැකිවී තිබේ.

"යහපත් ආහාර, යහපත් ජීවිතයක්' ('Good food, Good life') යන අපගේ ආයතනික ප්‍රතිඡ්ඨාව අනුව යමින්, නිරෝගීමත් පවුල්, සවිබලගැන්වූ ප්‍රජාවන් සහ හරිතවත් ශ්‍රී ලංකාවක් වෙනුවෙන් අපි වසර 115කට අධික කාලයක් පුරා දැඩි කැපවීමකින් යුතු දායකත්වයක් ලබාදුන්නා. එවන් පසුබිමක, ආහාර සහ පාන සමාගම් අංශයේ මෙම ශ්‍රේණිගත කිරීම හිමිවීම තුළින් නෙස්ලේ සමාගම කොතෙක් දුරට ශ්‍රී ලංකාවේ සමාජය තුළ මුල්බැසගෙන තිබේද යන්න හොඳින්ම පිළිබිඹු කරනවා. එවැනි ගෞරවයකින් පිදුම් ලැබීම අපට විශාල සතුටක්. අප සියලු දෙනා අභියෝග රැසකට මුහුණ දෙන මෙවැනි අවස්ථාවකදී, එවන් ගෞරවයක් ලැබීම තුළින් අපගේ ආදරණීය ශ්‍රී ලාංකික පාරිභෝගිකයින්ට තවදුරටත් සෞඛ්‍ය සම්පන්න සහ රසවත් නිෂ්පාදන සැපයීමටත්, අපගේ සැපයුම් දාමය පුරා විසිරී සිටින පාර්ශ්වකරුවන් හා එක්ව ප්‍රජාව සහ පරිසරය වෙනුවෙන් අපගේ කාර්යභාරය අඛණ්ඩව ඉදිරියට කරගෙනයාමටත් අපට විශාල ධෛර්යයක් ලබා දෙනවා", යනුවෙන් නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙනා මහතා ප්‍රකාශ කළේය.

ලොව විශාලතම ආහාර සහ පාන නිෂ්පාදන සමාගම වන නෙස්ලේ යනු වසර 115කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික ජීවිතවලට බද්ධ වූ සමාගමකි. 'වර්තමාන මෙන්ම අනාගත පරපුරටත් ජීවිතයේ ගුණාත්මකබව වර්ධනය කරගැනීම සඳහා ආහාර සතු ශක්තිය මුදාහැරීමේ' අරමුණ සමඟ ක්‍රියා කරන නෙස්ලේ සමාගම, තම ආහාර සහ පාන වර්ග නිෂ්පාදන පෙළ හරහා මුල් ළමාවියේ සිට වැඩිහිටි විය දක්වා පුළුල් පරාසයක පාරිභෝගිකයින්ට සමීප වී ඇත.

ශ්‍රී ලංකාව තුළ අලෙවි කරන නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි එම සමාගමට අයත් අති නවීන කර්මාන්තශාලාවේ නිපදවනු ලබන අතර, නෙස්ලේ ලංකා සමාගම මෙරට සමාජ ආර්ථික සංවර්ධනයට ලබාදෙන්නේ

අනුපමේය දායකත්වයකි. විශේෂයෙන්ම, 800කට වැඩි සේවක සංඛ්‍යාවකට සෘජු රැකියා අවස්ථා සපයන නෙස්ලේ ලංකා සමාගම, ශ්‍රී ලංකාවේ දැවැන්තම පිටි කළ පොල්කිරි අපනයනකරුවෙකු සහ විශාලතම නැවුම් එළකිරි මිලදීගන්නා ආයතනයක් ලෙස 25,000කට වැඩි ගොවි පවුල් සංඛ්‍යාවකටත්, සෙසු ව්‍යාපාර සහකරුවන්ටත් සහාය වෙයි. එමෙන්ම, 2050 වසර වනවිට සිය සැපයුම් ජාලය තුළ කාබන් විමෝචනය ශූන්‍ය කිරීමේ අරමුණ පෙරදැරි කරගනිමින් කටයුතු කරන නෙස්ලේ සමාගම, සිය නිෂ්පාදන පරිසරයට යහපත් බවට සහතික කරගැනීමට ද දැඩි පරිශ්‍රමයක් දරයි.

LMD හි 'වඩාත්ම ගෞරවනීය සමාගම් ශ්‍රේණිගත කිරීම' යනු සමාගම් 100කට අධික සංඛ්‍යාවක සේවක ප්‍රතිචාර ඇසුරෙන් NielsenIQ ආයතනය සිදුකරනු ලබන සමීක්ෂණ වාර්තා පදනම් කරගනිමින් ප්‍රකාශයට පත්කරනු ලබන්නකි. එහිදී, ඒ ඒ සමාගම් සතු ගුණාත්මකභාවය පිළිබඳ ඇති අවධානය, නවෝත්පාදන, ආයතනික සමාජ සත්කාර, ආයතනික සංස්කෘතිය, ගතිකත්වය, අවංකභාවය, කළමනාකාරීත්ව පැතිකඩ සහ දැක්ම ඇතුළු විවිධ මාන ඔස්සේ මෙම ශ්‍රේණිගත කිරීම සිදුකෙරේ.

---


**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |
| Corp. Communications | Isuri Alahakoon | +94760395781 | Isuri.Alahakoon@lk.nestle.com |